මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **LAE/2023/59**

**2025.02.19**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023
### ඇප තැන්පත් ආපසු ගෙවීම

2023 වර්ෂයේ දී පැවැත්වීමට නියමිතව තිබී කල් තබන ලද (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී එකී ආඥා පනතේ 29 වන වගන්තිය යටතේ පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් තැන්පත් කරනු ලැබූ තැන්පතු, 2025.02.17 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ 2025 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතේ 2(3) වගන්තිය අනුව එම තැන්පතු සිදුකරනු ලැබූ තැනැත්තා වෙත නිකුත් කරන ලද ලදුපත, එම තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබූ විට එම තැනැත්තා වෙත ආපසු ගෙවිය යුතු යැයි දක්වා ඇත.

ඒ අනුව තැන්පත් කරන ලද ඇප මුදල් ආපසු ගෙවීම සඳහා,

- එකී ආඥා පනතේ 29(3) වන උප වගන්තිය යටතේ, ඇප තැන්පත් මුදල් භාර ගන්නා අවස්ථාවේ දී ඇප මුදල් තැන්පත් කරන ලද තැනැත්තා වෙත ලබාදෙන ලද ලදුපතෙහි මුල් පිටපත; හා
- ඇප තැන්පත් මුදල් ආපසු ඉල්ලීමේ ලිපියක්; සමඟ

ඇප මුදල් තැන්පත් කරන ලද අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත 2025.02.28 දිනට පෙර භාරදෙන ලෙස මෙයින් දන්වා සිටිමි.

2025.02.28 දිනට පෙර භාරදෙනු ලබන ඉල්ලීම් සඳහා අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මගින් අදාළ තැනැත්තන් වෙත ඇප තැන්පත් මුදල් ආපසු ගෙවීමට නොපමාව කටයුතු කරනු ඇති බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්